ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2014/2015
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II - LWU2314
කාලය : පැය එකයි (01) යි.

---

දිනය : 2015 නොවැම්බර් 13 | වේලාව : ප.ව. 12.30 - ප.ව. 01.30 දක්වා

---

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. "මූලික අයිතිවාසිකම් කාර්යක්ෂමව බලාත්මක වීම වැළැක්වීම සඳහා කාර්ය පටිපාටික විධිබද්ධතාවයන්ට ( procedural technicalities ) ඉඩ නොදිය යුතුය."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න (ලකුණු 20)

02. මර්වින්, මෑතකදී එළිදක්වන ලද "බලය" නමැති සතිපතා පළවන පුවත්පතේ දේශපාලන තීරු ලිපියේ රචකයාය. බලයේ සිටින ආණ්ඩුවේ අමාත්‍යවරුන් කිහිපදෙනෙකු සම්බන්ධවූ දූෂණ සහ අක්‍රමිකතා පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි කිහිපයක් ඔහු විසින් ලියන ලදි. එසේම, මහජන මුදලින් නිළියන් සමග සමීප සබඳතා පවත්වන ලද බවට දක්වන ඔහුගේ ලිපි මඟින් ඔවුන්ගේ ජීවන රටාව විවේචනයට ලක් විය. මෙම පුවත්පත ඉක්මනින් ප්‍රසිද්ධියට පත් වූ අතර එහි අන්තර්ගත දෑ රටේ ජනතාව අතර නිරන්තර කතාබහට ලක් වන මාතෘකා බවට පත් විය.

ආණ්ඩුව විසින් හදිසියේම "බලය" පුවත්පත තහනම් කරන ලදි. ආණ්ඩුවේ එම නියෝගයට එරෙහිව මාධ්‍යවේදීන්, එම පුවත්පතේ කාර්ය මණ්ඩලය සහ සිවිල් සංවිධානයක් වන "මීඩියා ෆෝරම්" ආයතනය කොළඹදී විරෝධතා ව්‍යාපාරයක් සංවිධානය කළේය. එම විරෝධතාවයේදී, ඔවුන් "දූෂිත ඇමතිවරු පළවා හරිනු" වැනි සටන් පාඨ ඇතුළත් බැනර් සහ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කළේය. එසේම, ඔවුන් කැබිනට් අමාත්‍යවරුන්ට සමානව සැකසූ අනුරූ පුළුස්සා දැමීය.

විරෝධතා ව්‍යාපාරය අතරතුරේදී, පොලිසිය විරෝධතාකරුවන්ට පහරදුන් අතර ඔවුන්ගේ බැනර් සහ දැන්වීම් පුවරු විනාශ කළේය. මර්වින්ද ඇතුළු කාර්ය මණ්ඩලයේ නිළධාරීන් කිහිපදෙනෙකුව පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබිය. සිදුවීමෙන් සති දෙකක කාලයක් ගත වුවද තවමත් ඔවුන් අත්අඩංගුවේ පසුවේ.

i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් පොලිසිය විසින් උල්ලංඝනය කර ඇත්දැයි මර්වින් ඔබගෙන් විමසා සිටියි. මර්වින්ට උපදෙස් දෙන්න. (ලකුණු 12)

ii) රටේ සිවිල් සංවිධානයක් වන "මීඩියා ෆෝරම්" ආයතනයට මර්වින් වෙනුවෙන් මූලික අයිතිවාසිකම් නඩුකරයක් ගොනුකළ හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 08)

- හිමිකම් ඇවිරිණි -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B. DEGREE PROGRAMME – LEVEL 4**
**CONTINUOUS ASSESSMENT TEST II- 2014/2015**
**CONSTITUTIONAL LAW II – LWU 2314**
**DURATION - ONE (01) HOUR**

---

**Date: 13.11.2015** **Time: 12.30 p.m. -01.30 p.m.**

---

Answer **ONE(01)** question only
**Students will be penalized for illegible handwriting.**

1. "Procedural technicalities should not be allowed to hinder effective enforcement of fundamental rights."

   Do you agree with this statement? Give reasons for your answer. (20 marks)

2. Mervin is the writer of the political column in "Balaya", a weekly newspaper which was launched recently. He wrote several articles containing information regarding malpractices and corruption in which several ministers of the present government were involved. His articles also criticized their lifestyles claiming that they maintain close connections with actresses at public cost. This newspaper quickly became popular and its content became a regular topic of discussion among people in the country.

   The government suddenly banned the "Balaya" newspaper. Journalists, the staff of the newspaper and 'Media Forum', a civil society organization, organized a protest campaign against the order of the government, in Colombo. At the protest they displayed banners and placards with slogans such as 'overthrow corrupted Ministers'. They also burnt several dummies of cabinet ministers during the protest.

   The Police attacked the protesters during the protest campaign and destroyed their banners and placards. Several staff members including Mervin were arrested by the Police. Although two weeks have passed since the incident the persons arrested are still being held in remand.

   I. Marvin seeks your advice as to whether any of his fundamental rights guaranteed in the 1978 Constitution has been violated by the police? Advise Mervin. (12 marks)

   II. Can "Media Forum" file a fundamental rights case on behalf of Mervin? Explain. (08 marks)

****Copyrights reserved****